# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

## වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය

## 2012 ජනවාරි 01 - 2012 දෙසැම්බර් 31

2 – CM 017026

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
අංක 155/15, කාසල් වීදිය,
කොළඹ 08.
2013.02.28

ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ඇමතිතුමා,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
අංක 163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

# වාර්ෂික වාර්තාව - 2012

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වැනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය අනුව ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

01. 2012 ජනවාරි මස 01 වැනි දින සිට 2012 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා මණ්ඩලයෙන් ඉටු කෙරුණ කාර්යභාරය;

02. විගණකාධිපතිගේ වාර්තාව;

03. එම කාලපරිච්ඡේදය සඳහා අවසන් ගිණුම් ප්‍රකාශනයේ පිටපතක්.

මෙයට,
විශ්වාසී,

ජනාධිපති නීතිඥ, ඩබ්ලිව්. දයාරත්න,
සභාපති.

# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව – 2012

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**

1973 අංක 5 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පිහිටුවීමේ අපේක්ෂාව වූයේ,**

(i) ශ්‍රී ලංකාවේ පුවත්පත්වල නිදහස ආරක්ෂා කිරීම
(ii) එම නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීම වලක්වාලීම
(iii) සත්‍ය තොරතුරු දැන ගැනීමේ ජනතා අයිතිය තහවුරු කිරීමත් ය.

2012.01.01 දින සිට අංක 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 ස්ථානයේ පවත්වාගෙන යනු ලැබිය.

**01. මණ්ඩලයේ සැකැස්ම**

අර්ධ අධිකරණමය කාර්ය භාරයක් ඉටු කරන පුවත්පත් මණ්ඩලය සාමාජිකයන් හත්දෙනෙකුගෙන් (07) සමන්විත වේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ (වර්තමානයේ අධ්‍යක්ෂ ජනරාල්) නිල බලයෙන් මණ්ඩලයේ සාමාජිකත්වය ලබයි. සාමාජිකයින් හයදෙනෙකු පත් කිරීම සිදු වන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසිනි. ඉන් එක් තැනැත්තෙකු ක්‍රියාකාරී පත්‍ර කලාවේදීන් නියෝජනය කරන තැනැත්තෙකු විය යුතු අතර, තවත් සාමාජිකයෙකු පුවත්පත් ව්‍යාපාරයේ සේවකයන්ගේ සම්බන්ධතා නියෝජනය කරන තැනැත්තෙකු ගෙන් සමන්විත වේ. පත් කරනු ලබන දින සිට සාමාජිකයන්ගේ නිල කාලය වසර 03 කි.

අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරන ලද මණ්ඩලයේ සභාපති හා සාමාජිකත්වයේ නාම ලේඛනය පහත පරිදි විය:-

| තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|
| සභාපති | ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා | 2012.06.14 |
| සාමාජික | මහාචාර්ය ආරියරත්න ඇතුගල මහතා | 2010.06.04 |
| සාමාජික | මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා | 2012.06.14 |
| සාමාජික | නීතිඥ චන්දන ප්‍රසාද් සූරියආරච්චි මහතා | 2012.06.14 |
| සාමාජික | ආරියනන්ද දොඹගහවත්ත මහතා | 2012.06.14 |
| සාමාජික | ප්‍රදීප විජේසුන්දර මහතා | 2011.09.05 |
| සාමාජික | කරුණාදාස සූරියආරච්චි මහතා | 2012.06.14 |

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ඉහත සඳහන් සාමාජිකයින්ට අමතරව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අමාත්‍යතුමා විසින් 2012.04.02 දින මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ලෙස එම්.කේ.ඩී.එන්.මාදම්ප මහත්මිය පත් කරනු ලැබිය.

**02. මණ්ඩලයේ රැස්වීම්**

සභාපතිතුමාගේ හා සාමාජික මහතුන්ගේ ප්‍රධානත්වයෙන් මණ්ඩල රැස්වීම් 22 ක් 2012 වර්ෂය තුළ දී පැවැත්විණි.

**03. පැමිණිලි**

සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව පැමිණිලි පිළිබඳ විභාග 42 ක් ලැබී තිබුණි.

එසේම 2011 වසරෙන් ඉදිරියට ගෙනා මණ්ඩලයට ක්‍රියාමාර්ග ගැනීමට ඇති පැමිණිලි සංඛ්‍යාව 10 කි.

| | |
|---|---|
| පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන | - 10 |
| 2012 වසරේ ලද පැමිණිලි සංඛ්‍යාව | - 42 |
| 2012 වසරේ විභාග කළ මුළු පැමිණිලි ගණන | - 52 |

එසේ ලද පැමිණිලිවල මූලයන් පහත පරිදි බෙදා දැක්විය හැකිය.: –

1. පුද්ගලයන්
2. ආයතන ප්‍රධානීන් /අමාත්‍යාංශ ලේකම්වරුන්
3. ආචාර්යවරුන්
4. විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරීන්
5. පූජක පක්ෂය
6. ගුරුමහත්ම, මහත්මීන්
7. සමිති සමාගම්

සමාලෝචිත වර්ෂයට අදාළ මුළු පැමිණිලි 52 ක සම්බන්ධයෙන් මණ්ඩලය තීරණ ලබා ගත් ආකාරය පහත සඳහන් පරිදි වේ: –

| | |
|---|---|
| විමර්ශන කටයුතු වෙමින් පවතින | 21 |
| එකඟතාවයට පත් වූ | 08 |
| ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ | 12 |
| නිෂ්ප්‍රභ කිරීම | 05 |
| නියෝග (2011 වසරින් පැමිණිලි 3) | 06 |
| | 52 |

"ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ" වර්ගීකරණය පහත සඳහන් නිර්නායකයන් මත පදනම් විය: –

- පැමිණිල්ල පුවත්පත් මණ්ඩලීය විෂය පථයට අදාළ නොවීම.
- පැමිණිලි පාර්ශවය නියමිත කාලයට අවශ්‍ය ලේඛණ ඉදිරිපත් නොකිරීම.
- පැමිණිල්ල විභාග වන අතරතුර පැමිණිලි පාර්ශවය ඒ සඳහා සහභාගී නොවීම.
- පැමිණිල්ලට අදාළ පුවත්පත ඒ වන විට ප්‍රකාශයට පත් නොකිරීම.
- අදාළ පුවත්පත් වාර්තාවෙන් පැමිණිලිකරුට අගතියක් නොවීම.
- පැමිණිලිවලට අදාළව අධිකරණයේ නඩුවක් විභාගයට ගැනීම.

### 04. කාර්ය මණ්ඩලය

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර නව ආකෘතියට අනුව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කරමින් සිටියි.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ කාර්යාල කාර්ය සහයක (ආරච්චි) තනතුර දැරූ එල්.එම්.ජී. නන්දසිරි මහතා 2012.11.19 දිනත්, පණිවිඩකරු තනතුර දැරූ ආර්.කේ. සිරිපාල මහතා 2012.03.20 දිනත්, වයස අවුරුදු 60 සම්පූර්ණ කර සේවයෙන් විශ්‍රාම ගත්තේ ය. වර්තමානයේ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 10 කි.

| | | |
|---|---|---|
| 1. | එස්.ඒ.ජගත්සිරි මහතා | ගණකාධිකාරී |
| 2. | එච්.එස්.විජේරත්න මිය | ප්‍රවෘත්ති විමර්ශක |
| 3. | ඉන්ද්‍රානි මුරුගේසු මිය | භාෂා/භාෂණ පරිවර්තිකා |
| 4. | ටී.ඒ.අනෝමා ප්‍රියන්ති තිලකරත්න මිය | පරිගණක ක්‍රියාකරු |
| 5. | ටී.එන්.නිල්මිණී පීරිස් මිය | ගිණුම් සහකාර |
| 6. | කේ.ජී.එන්.එච්.පතිරත්න මිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |
| 7. | කේ.එල්.චන්ද්‍රපාල මහතා | රියදුරු |
| 8. | ජී.බී.කරුණාතිලක මහතා | රියදුරු |
| 9. | කේ.ජී.එෆ්.විජේරත්න මහතා | කාර්යාල කාර්ය සහයක |
| 10. | එච්.ඒ.ටී.විජේරත්න මහතා | කාර්යාල කාර්ය සහයක |

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජේ.ඩී.සී.ජයසිංහ මහතා 2011.12.23 දින සිට 2012.09.05 දින දක්වා වැඩ බලන පුවත්පත් කොමසාරිස් තනතුරට පත් කර ඇත. ඉන් පසුව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) කේ.එම්.ජී.එස්. නාලක කළුවැව මහතා 2012.09.18 දින සිට වැඩ බලන පුවත්පත් කොමසාරිස් තනතුරට පත් කර ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සහකාර කොමසාරිස් (විමර්ශන) තනතුරට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහකාර තනතුර දරූ ටී. නිරෝෂණ මහතා 2009.09.01 සිට 2012.08.31 දක්වා ද්විතියන පදනම මත වසර 3 ක කාලයක් පත්කර තිබූ අතර එම කාලය තවත් හය මසකින් දීර්ඝ කර ඇත.

### 05. අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නිකුත් කරනු ලබන විධාන

සමාලෝචිත කාලය තුළ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නියෝග නිකුත් නොකළේ ය.

## 06. මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

(1) පහත සඳහන් ප්‍රාදේශීය සන්නිවේදන වැඩමුළු හා සම්මන්ත්‍රණ 2012 වසරේ දී පවත්වන ලදී.

| දිනය | වැඩමුළුව | සහභාගී වූ මාධ්‍යවේදීන්/ පාසල් සිසුන් සංඛ්‍යාව | පැවැත් වූ ස්ථානය |
|---|---|---|---|
| 2012.05.18 | කුලියාපිටිය පාසල් ජනමාධ්‍ය වැඩමුළුව | 200 | කුලි/ සාරානාත් මහා විද්‍යාලය, කුලියාපිටිය. |
| 2012.06.26 | වෘත්තීය මාධ්‍යවේදී වැඩමුළුව | 126 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, පොල්හේන්ගොඩ, කොළඹ 5. |
| 2012.06.30 | ත්‍රිකුණාමල දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 65 | ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |
| 2012.08.25 | මහනුවර දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 110 | "Oak Ray" Hotel , Kandy. |
| 2012.10.08 | මහනුවර දිස්ත්‍රික් පාසල් ජනමාධ්‍ය වැඩමුළුව | 200 | වළල මධ්‍ය මහා විද්‍යාලය මහනුවර |
| 2012.10.09 | මහනුවර දිස්ත්‍රික් පාසල් ජනමාධ්‍ය වැඩමුළුව | 200 | නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය මහනුවර. |
| 2012.11.24 | කළුතර දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 74 | Garden Beach Hotel, Kalutara. |
| 2012.12.15 | අම්පාර දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 81 | Monty Hotel, Ampara. |

### දැයට කිරුළ වැඩසටහන

2012 දැයට කිරුළ වැඩසටහන සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයෙන් ද ප්‍රදර්ශන කුටියක් අනුරාධපුර "ඔයාමඩුවේදී". පවත්වන ලදී.

### පුවත්පත් කලාව හා සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව:

මාධ්‍යවේදීන් 25 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඔවුන්ගේ විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීම අරමුණු කර 2012.10.13 දින පුවත්පත් කලාව හා සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ III කණ්ඩායමේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.

### සිකුරාදා දිනවල පැවැත්වෙන සන්නිවේදන කතිකාවත:

කාලීන වශයෙන් වැදගත් ප්‍රකාශනයන් ඉලක්ක කර සන්නිවේදන කතිකාවත නම් සාකච්ඡාමය වැඩ සටහනක් සෑම සිකුරාදා දිනකම පස්වරුවේ පවත්වන ලදී.

2012 වසරේ මණ්ඩලයේ ලියාපදිංචි පුවත්පත් සංඛ්‍යාව 191 ක් වේ.

## 07. මුදල්

(i) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. 19,600,000 ක මුදලක් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අනුමත කරන ලදී. මෙම මුදලින් රු. 16,601,000 ක් මණ්ඩලයේ වියදම් සඳහා වර්ෂය තුළ දී මහා භාණ්ඩාගාරයෙන් මාසික වාරික වශයෙන් මුදා හරින ලදී. රු. 3,000,000 ක මුදලක් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට මාරු කරන ලදී.

(ii) 2012 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 682,000 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ලදී.

III. රජයේ දායකය සහ පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු හැරුණු විට 2012 වර්ෂය තුළ දී මණ්ඩල අරමුදලට බැර කරන ලද ලැබීම් මෙසේ ය.

| | | |
|---|---|---|
| ආපසු ලැබීම් , තැන්පත් සහ වෙනත් අවකරණ | රු. | 3,791,024.05 |
| ප්‍රමාද ගාස්තු ආදායම් | රු. | 102,550.00 |
| | | 3,893,574.05 |

IV. ලැබීම් සහ ගෙවීම් ගිණුම

කලින් වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය සමග වර්ෂය තුළ මුළු ලැබීම් රු. 21,227,495.39 ක් විය. වර්ෂය තුළ මුළු ගෙවීම් රු. 21,052,889.35 ක් විය. 2012 වර්ෂය අවසාන වන විට මණ්ඩල අරමුදල් ගිණුමේ බැරට තිබූ ශේෂය රු. 174,606.04 ක් විය.

V. ආදායම් සහ වියදම් ගිණුම

පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ද ඇතුළුව වර්ෂය තුළ මුළු ආදායම රු. 17,481,423.11 ක් වූ අතර මුළු වියදම රු. 17,561,071.10 ක් විය. ආදායම් ඉක්ම වූ වියදම රු. 79,647.99 ක් 2012 වර්ෂයේ දී මණ්ඩල අරමුදලට හර කරන ලදී.

VI. මණ්ඩල සමුච්චිත අරමුදල

2012 වර්ෂය ආරම්භයේ දී මණ්ඩල අරමුදලේ හර ශේෂය රු. 1,767,961.23 කි. වර්ෂය ආරම්භයේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 4,115,000.00 කි. වර්ෂය තුළදී ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම සඳහා ලද මුදල රු. 682,000 කි. 2010 වර්ෂයේ දී ස්ථාවර වත්කම් (වාහන) රු. 777,475.00 ක් වශයෙන් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු මෙම වර්ෂයේ දී මෝටර් රථය විකිණීමෙන් ලද රු. 757,500 ක මුදල ආපසු භාණ්ඩාගාරය වෙත යැවීමෙන් පසු හා ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 14,566,975 ක් විය. වර්ෂය තුළ ආදායම ඉක්ම වූ වියදම රු. 79,647.99 ක් සහ කලින් වර්ෂයට ගැලපුම් වෙනුවෙන් රු. 8,754.33 ක් මණ්ඩල අරමුදලට මාරු කිරීමෙන් පසු වර්ෂය අවසානයේ මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය රු. 12,728,120.11 ක් විය.

මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය ද, පාරිතෝෂික අරමුදල සඳහා වෙන් කිරීම් වන රු. 3,334,106.00 ක් සහ ප්‍රවර්තන බැරකම් වන රු. 143,703.55 ක්ද ඇතුළුව මුළු වගකීම් ප්‍රමාණය ස්ථාවර වත්කම් වන රු. 10,423,189.19 ක්, පාරිතෝෂික, පර්යේෂණ ණය අරමුදල් හා වෙනත් තැන්පත් රු. 2,381,293.06 ක් හා ප්‍රවර්තන වත්කම් රු. 3,401,447.41 ක් මගින් නියෝජනය වේ.

VII. පුවත්පත් ලියාපදිංචි කිරීම

2012 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 85,000 ක් ලැබුණි.

**08. ස්තුතිය**

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයෙන් ලැබුණු නිවැරදි උපදෙස් සහ සහයෝගය මෙන්ම වගකීම් හා යුතුකම් ඉටු කිරීමේදී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල කාර්ය මණ්ඩලයේ සියලුදෙනා විසින් දක්වන ලද ඇප කැපවීමද අගය කරමි.

ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න,
සභාපති.

2013 පෙබරවාරි මස 28 වැනි දින.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
අංක 155/15, කාසල් වීදිය,
බොරැල්ල,
කොළඹ 08.

## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2012 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය

| 2010 | විස්තරය | | | 2010 | විස්තරය | පිරිවැය | සමුච්චිත ක්ෂයවීම් | ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|
| (රු.ශත) | | (රු.ශත) | (රු.ශත) | (රු.ශත) | | (රු. ශත) | (රු. ශත) | (රු. ශත) |
| | **රජයේ දායකය** | | | | **ස්ථාවර වත්කම්** | | | |
| 3,415,000.00 | ප්‍රාග්ධන අරමුදල | 4,115,000.00 | | 10,263,500.00 | වාහන | 9,947,680.00 | 1,044,000.00 | 8,903,680.00 |
| 700,000.00 | භාණ්ඩාගාරයෙන් ලද දායකය | 682,000.00 | | 484,620.75 | ලී බඩු හා සවිකිරීම් | 1,218,807.75 | 694,388.00 | 524,419.75 |
| - | භාණ්ඩාගාරය වෙත යැවීම් | (757,500.00) | | 788,065.77 | කාර්යාල හා සුහසාධන උපකරණ | 1,830,367.58 | 960,426.00 | 869,941.58 |
| 777,475.00 | වාහන තක්සේරු වෙන්කිරීම | 777,475.00 | | 124,177.86 | පුස්තකාල පොත් | 177,244.48 | 52,096.62 | 125,147.86 |
| 9,750,000.00 | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනීත කිරීම | 9,750,000.00 | 14,566,975.00 | 11,660,364.38 | | 13,174,099.81 | 2,750,910.62 | 10,423,189.19 |
| | **මණ්ඩල අරමුදල (සමුච්චිත)** | | | | | | | |
| | 2012.12.31 දිනට ශේෂය | (1,759,206.90) | | | | | | |
| (1,767,961.23) | එකතුකළා:ආදායමට වැඩි වූ වියදම | (79,647.99) | (1,838,854.89) | | | | | |
| 12,874,513.77 | | | 12,728,120.11 | | | | | |
| | | | | 93,429.08 | පර්යේෂණ අරමුදල | | | 510,822.19 |
| | | | | 385,152.45 | ණය අරමුදල - ජා.ඉ.බැං. | | | 697,058.06 |
| | | | | 927,991.39 | පාරිතෝෂික අරමුදල | | | 618,412.81 |
| | | | | 106,765.68 | බාහිර ආයතනවල ඇති තැන්පතු | | | 555,000.00 |
| | **වෙන්කිරීම්** | | | | | | | |
| 3,601,276.13 | පාරිතෝෂික අරමුදල | | 3,334,106.00 | | **ජංගම වත්කම්** | | | |
| | | | | 408,661.79 | පොත් තොග | | 340,658.80 | |
| | ජංගම වගකීම් | | | 46,948.74 | ලිපිද්‍රව්‍ය තොග | | 113,070.58 | |
| 500.00 | විවිධ ණය හිමියෝ | 500.00 | | 195,390.17 | ලැබිය යුතු ආදායම් | | 83,011.17 | |
| 150,544.15 | උපචිත වියදම් | 143,203.55 | 143,703.55 | 14,000.00 | ලැබිය යුතු උත්සව අත්තිකාරම් | | 13,000.00 | |
| | | | | 1,698,177.50 | ලැබිය යුතු ආපදා ණය | | 1,511,938.50 | |
| | | | | 1,030,831.53 | කලින් ගෙවීම් | | 1,165,162.32 | |
| | | | | 50,921.34 | බැංකුවේ ඇති මුදල්-ගි.අ.- 078100142268327 | | 174,606.04 | |
| | | | | 8,200.00 | අත ඉතිරි මුදල් | | - | 3,401,447.41 |
| 16,626,834.05 | | | 16,205,929.66 | 16,626,834.05 | | | | 16,205,929.66 |

**පුවත්පත් කොමසාරිස්**
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2013 පෙබරවාරි 28

**ගණකාධිකාරී**
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2013 පෙබරවාරි 28

**සභාපති**
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2013 පෙබරවාරි 28



3 - CM 017026

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම්

| 2010 (රු.ශත) | | විස්තරය | (රු. ශත) | 2011 (රු. ශත) |
|---|---|---|---|---|
| | | **වියදම්** | | |
| | 1 | **පුද්ගල පඩිනඩි:** | | 7,627,987.20 |
| 5,258,458.30 | | වේතන හා වැටුප් | 5,176,969.43 | |
| 350,305.14 | | අතිකාල සහ නිවාඩු දින සඳහා ගෙවීම් | 366,897.00 | |
| 621,774.35 | | සේ.අ.අ.මණ්ඩලයේ දායකත්වය | 601,790.17 | |
| 124,354.79 | | සේ.නි.භා.අ.මණ්ඩලයේ දායකත්වය | 120,357.98 | |
| 281,000.00 | | සාමාජික දීමනා | 480,000.00 | |
| 426,247.01 | | සේවක පාරිතෝෂික | 520,967.62 | |
| 12,000.00 | | විගණන කළමනාකරණ කමිටු රැස්වීම් ගාස්තු | 64,000.00 | |
| - | | අනෙකුත් දීමනා | 297,005.00 | |
| | 2 | **ගමන් වියදම්:** | | 104,071.00 |
| 15,086.00 | | කාර්ය මණ්ඩල - දේශීය | 18,710.00 | |
| 30,012.50 | | සාමාජික | 85,361.00 | |
| | 3 | **සැපයුම් හා අවශ්‍යතා:** | | 983,395.30 |
| 87,360.56 | | ලිපි ද්‍රව්‍ය | 226,547.40 | |
| 612,822.00 | | ඉන්ධන හා ලිහිසි තෙල් | 427,639.00 | |
| - | | ඉන්ධන දීමනා | 232,000.00 | |
| 13,564.00 | | කාර්යාලයීය අවශ්‍යතා | 48,381.00 | |
| - | | වෛද්‍ය පහසුකම් | 900.00 | |
| 22,870.00 | | නිල ඇඳුම් | 28,152.90 | |
| 59,935.00 | | පුවත්පත් හා වාර සඟරා | 19,775.00 | |
| | 4 | **අලුත්වැඩියා, නඩත්තු හා ක්ෂයවීම්:** | | 2,147,320.85 |
| | (අ) | අලුත්වැඩියා හා නඩත්තු | | |
| 322,932.54 | | වාහන | 57,307.66 | |
| 200,958.10 | | කාර්යාල හා සුභ සාධන උපකරණ | 53,566.08 | |
| 7,015.00 | | කාර්යාල ගොඩනැගිලි | 29,741.00 | |
| - | | කාර්යාල ලී බඩු හා සවි කිරීම් | | |
| 169,075.20 | | පිරිසිදු කිරීමේ සේවය | 3,500.00 | |
| | | | 165,734.40 | |
| | (ආ) | ක්ෂයවීම් | | |
| 150,000.00 | | වාහන | 904,000.00 | |
| 231,685.33 | | කාර්යාල හා සුභ සාධන උපකරණ | 300,664.50 | |
| 158,726.00 | | කාර්යාල ලී බඩු හා සවි කිරීම් | 205,026.00 | |
| 350.00 | | පුස්තකාල පොත් | 630.00 | |
| | (ඇ) | කපා හැරීම් | | |
| - | | වාහන | - | |
| - | | කාර්යාල හා සුභ සාධන උපකරණ | - | |
| 200.00 | | කාර්යාල ලී බඩු හා සවි කිරීම් | - | |
| 384,720.00 | (ඇ) | ආරක්ෂක සේවා | 427,151,21 | |

| 2010 (රු.ශත) | | විස්තරය | (රු.ශත) | 2011 (රු.ශත) |
|---|---|---|---|---|
| | 5 | **ප්‍රවාහන,සන්නිවේදන භාවිතය සහ වෙනත් සේවා** | | 3,348,089.49 |
| - | | ප්‍රවාහන | 55,720.00 | |
| 480,000.00 | | ප්‍රවාහන දීමනා | 348,000.00 | |
| 198,794.01 | | සන්නිවේදන - දුරකථන සේවා | 236,550.85 | |
| 17,730.00 | | සන්නිවේදන - තැපැල් | 26,209.00 | |
| 128,377.46 | | විදුලිය භාවිතය | 157,790.84 | |
| 1,410,000.00 | | කාර්යාල ගොඩනැගිලි කුලී | 1,920,000.00 | |
| 36,017.47 | | ජල බද්ද | 25,051.30 | |
| 58,234.32 | | අනුපාත හා බදු | - | |
| 225,081.28 | | ප්‍රකාශන හා දැන්වීම් | 37,665.60 | |
| 51,362.21 | | මුද්‍රණය හා පොත් බැඳීම | 164,423.00 | |
| 131,463.60 | | සංග්‍රහ වියදම් | 139,013.94 | |
| - | | නිල ආගමික උත්සව | 20,305.00 | |
| 22,495.00 | | විගණන ගාස්තු | 26,880.00 | |
| 11,032.50 | | අනියම් වියදම් | 22,625.00 | |
| 22,904.07 | | බැංකු ගාස්තු | 12,708.00 | |
| 70,593.46 | | මෝටර් රථ රක්ෂණය හා ලියාපදිංචිය | 155,146.96 | |
| 100,000.00 | | නීති ගාස්තු | | |
| | | පැමිණිලි පිරිවැය | 7,000.00 | 7,000.00 |
| | 6 | **දීමනා ප්‍රදානයන් සහ ආධාර** | | 3,343,207.26 |
| 1,132,726.00 | | ප්‍රාදේශීය සන්නිවේදන වැඩමුළු | 1,686,068.48 | |
| 1,047,186.36 | | ඩිප්ලෝමා පාඨමාලා | 521,719.00 | |
| 853,887.66 | | දැයට කිරුළ වැඩසටහන | 1,117,919.78 | |
| - | | ප්‍රකාශන | 3,000.00 | |
| - | | කාර්ය මණ්ඩල පුහුණු පාඨමාලා | 14,500.00 | |
| 15,539,337.22 | | | | 17,561,071.10 |
| | | **ආදායම** | | |
| 61,350.00 | | ලියාපදිංචි ගාස්තු | | 86,000.00 |
| 6,650.00 | | පොත් විකුණුම් කොමිස් | | |
| 395.00 | | පිටපත් ගාස්තු | | 275.00 |
| 80,507.26 | | කාර්ය මණ්ඩල ණය මත පොළී | | 68,317.90 |
| 109,200.00 | | ප්‍රමාද ගාස්තු | | 102,550.00 |
| 1,210.77 | | පොත් විකිණීමේ ගිණුම | | 4,082.29 |
| 42,911.55 | | පොළී - ඉතිරි කිරීමේ ගිණුම් | | 57,797.92 |
| - | | වාහන රක්ෂණ වන්දි | | - |
| - | | ඩිප්ලෝමා පාඨමාලා ආදායම | | 265,500.00 |
| 39,250.00 | | වාහන විකුණුම් ලාභ | | 257,500.00 |
| 320,500.00 | | මුදල් නොවූ චෙක් | | 38,400.00 |
| 14,877,362.64 | | ආදායමට වැඩි වූ මුළු වියදම | | 16,680,647.99 |
| 14,000,000.00 | | රජයේ දායකය | | 16,601,000.00 |
| (877,362.64) | | රජයේ දායකයට පසු ආදායමට වැඩි මුළු වියදම | | (79,647.99) |

| **පුවත්පත් කොමසාරිස්** | **ගණකාධිකාරී** | **සභාපති** |
|---|---|---|
| ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය |
| 2013 පෙබරවාරි 28 | 2013 පෙබරවාරි 28 | 2013 පෙබරවාරි 28 |

## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2012.01.01 දින සිට 2012.12.31 දක්වා ලැබීම් සහ ගෙවීම් ගිණුම

| විෂය සංචිතය | ලැබීම් | මුදල රු.ශත |
|---|---|---|
| **01.01.2012** | **ඉදිරියට ගෙනා ශේෂය** | **50,921.34** |
| 1-1-01-1 | වැටුප් හා වේතන | 47,690.85 |
| 1-1-01-4 | සේ.අ.අ.මණ්ඩලයේ දායකත්වය | 0.00 |
| 1-1-01-6 | සාමාජික වියදම් | 0.00 |
| 1-1-01-8 | විගණන කළමනාකරණ කමිටු රැස්වීම් ගාස්තු | 0.00 |
| 1-1-03-01 | ලිපි ද්‍රව්‍ය | 0.00 |
| 1-1-04-01(1) | කාර්යාලයීය හා සුභ සාධන උපකරණ අළුත්වැඩියා හා නඩත්තු | 0.00 |
| 1-1-05-3 | විදුලිය භාවිතය | 10,841.60 |
| 1-1-05-4 | කාර්යාලයීය ගොඩනැගිලි | 0.00 |
| 1-1-05-9(2) | සංග්‍රහ වියදම් | 140.00 |
| 1-1-05-9(7) | අනියම් වියදම් | 0.00 |
| 1-1-07-1 | ප්‍රාදේශීය සන්නිවේදන වැඩමුළු | 0.00 |
| 1-1-07-2 | භාෂා පාඨමාලා | 0.00 |
| 1-1-09-1(1) | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | 68,677.50 |
| 14 | දේශීය මිලට ගැනුම් අත්තිකාරම් | 556,830.80 |
| 14.1 | උපයන විට ගෙවීම් බදු | 61,357.67 |
| 15.1 | උත්සව අත්තිකාරම් | 2,000.00 |
| 15.2 | කාර්ය මණ්ඩලය සඳහා ආපදා ණය | 21,190.00 |
| 17 | සුළු මුදල් | 2,787.00 |
| 18 | විවිධ ලැබීම් | 401,193.29 |
| 20 | මුදල් නොවූ චෙක්පත් | 40,400.00 |
| 21.01 | ලැබියයුතු ආදායම් | 500.00 |
| 22 | අවිනිශ්චිත ගිණුම් | 945,889.98 |
| 30 | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | 16,601,000.00 |
| 30.01 | භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන | 682,000.00 |
| 31 | ලියාපදිංචි ගාස්තු | 85,000.00 |
| 31.01 | ප්‍රමාද ගාස්තු | 102,550.00 |
| 33 | පිටපත් ගාස්තු | 275.00 |
| 35 | විවිධ ණයහිමියෝ | 0.00 |
| 37 | වැටුප් ණය මත පොලී | 54.68 |
| 38 | මණ්ඩල අරමුදල | 82,190.00 |
| 41 | පොත් විකුණුම් ගිණුම | 1,050.00 |
| 43 | පාරිතෝෂික අරමුදල | 636,690.00 |
| 43 | පාරිතෝෂික අරමුදල | 66,765.68 |
| 44 | විවිධ තැන්පතු | 2,000.00 |
| 47 | සිසුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 0.00 |
| 49 | වාහන වන්දි | 0.00 |
| 52 | ස්ථාවර තැන්පතු - 078-60-01-00004780-1 | 0.00 |
| 53 | ස්ථාවර තැන්පතු - 2-006-07-79823 | 0.00 |
| 55 | වාහන විකුණුම් ගිණුම | 757,500.00 |
| | | **21,227,495.39** |
| **01.01.2013** | | **174,606.04** |

| විෂය සංචිතය | ගෙවීම් | මුදල රු.ශත |
|---|---|---|
| 1-1-01-1 | වැටුප් හා වේතන | 5,205,531.28 |
| 1-1-01-2 | අතිකාල හා නිවාඩු දින සඳහා ගෙවීම් | 326,279.00 |
| 1-1-01-4 | සේ.අ.අ.මණ්ඩලයේ දායකත්වය | 601,790.17 |
| 1-1-01-5 | සේ.නි.භා.අ.මණ්ඩලයේ දායකත්වය | 120,357.98 |
| 1-1-01-6 | සාමාජික වියදම් | 480,000.00 |
| 1-1-01-7 | සේවා පාරිතෝෂික | 788,137.75 |
| 1-1-01-8 | විගණන කළමනාකරණ කමිටු රැස්වීම් ගාස්තු | 64,000.00 |
| 1-101-9 | වෙනත් දීමනා | 268,505.00 |
| 1-1-02-01 | ගමන් වියදම් - කාර්ය මණ්ඩලය | 16,270.00 |
| 1-1-02-03 | ගමන් වියදම් - සාමාජික | 84,061.00 |
| 1-1-03-01 | ලිපි ද්‍රව්‍ය | 291,216.24 |
| 1-1-03-02 | ඉන්ධන ලිහිසි තෙල් | 427,639.00 |
| 1-1-03-02(1) | ඉන්ධන දීමනා | 232,000.00 |
| 1-1-03-03 | කාර්මික හා විදුලි උපකරණ | 0.00 |
| 1-1-03-04 | කාර්යාලයීය අවශ්‍යතා | 48,381.00 |
| 1-1-03-05 | වෛද්‍ය පහසුකම් | 900.00 |
| 1-1-03-07 | නිල ඇඳුම් | 28,152.90 |
| 1-1-03-08 | පුවත්පත් හා වාර සඟරා | 19,775.00 |
| 1-1-04-01(1) | වාහන අළුත්වැඩියා හා නඩත්තු | 46,502.66 |
| 1-1-04-01(2) | කාර්යාලයීය හා සුභ සාධන උපකරණ අළුත්වැඩියා හා නඩත්තු | 53,566.08 |
| 1-1-04-02(1) | කාර්යාල ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු | 28,881.00 |
| 1-1-04-2(1)-1 | පිරිසිදු කිරීමේ සේවය | 165,534.40 |
| 1-1-04-2(2) | කාර්යාල ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | 3,500.00 |
| 1-1-04-5(1) | ආරක්ෂක සේවය | 427,151.21 |
| 1-1-05-1 | ප්‍රවාහන | 55,720.00 |
| 1-1-05-1 | ප්‍රවාහන දීමනා | 348,000.00 |
| 1-1-05-2(1) | සන්නිවේදන - දුරකථන සේවා | 216,765.70 |
| 1-1-05-2(2) | සන්නිවේදන - තැපැල් | 26,029.00 |
| 1-1-05-3 | විදුලිය භාවිතය | 168,632.44 |
| 1-1-05-4 | කාර්යාලයීය ගොඩනැගිලි | 960,000.00 |
| 1-1-05-5 | ජල ගාස්තු | 25,051.30 |
| 1-1-05-8(1) | ප්‍රකාශන හා දැන්වීම් | 37,665.60 |
| 1-1-05-8(2) | මුද්‍රණ හා බැඳීම් | 162,423.00 |
| 1-1-05-9(2) | සංග්‍රහ වියදම් | 139,153.94 |
| 1-1-05-9(5) | කාර්යාලයීය හා ආගමික කටයුතු | 20,305.00 |
| 1-1-05-9(6) | විගණන ගාස්තු | 26,880.00 |
| 1-1-05-9(7) | අනියම් වියදම් | 21,925.00 |
| 1-1-05-9(8) | බැංකු ගාස්තු | 10,182.60 |
| 1-1-05-9(9) | මෝටර් රථ රක්ෂණ | 90,693.43 |
| 1-1-05-9(10) | නීති ගාස්තු | 0.00 |
| 1-1-07-1 | ප්‍රාදේශීය සන්නිවේදන වැඩමුළු | 350,993.00 |
| 1-1-07-2 | භාෂා පාඨමාලා | 282,615.00 |
| 1-1-07-3 | ප්‍රකාශන | 3,000.00 |
| 1-1-07-5 | කාර්ය මණ්ඩලය සහ පුහුණු පාඨමාලා | 14,500.00 |
| 1-1-07-7 | දැයට කිරුළ වැඩසටහන | 1,111,541.78 |
| 1-1-09-1(1) | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | 313,502.50 |
| 1-1-09-1(2) | කාර්යාලයීය හා සුභ සාධන උපකරණ | 382,540.31 |
| 1-1-09-1(3) | පුස්තකාල පොත් | 1,200.00 |
| 1-109-2 | වාහන | 44,180.00 |
| 14.00 | දේශීය මිලට ගැනුම් අත්තිකාරම් | 2,093,000.00 |
| 14.01 | උපයන විට ගෙවීම් බදු | 61,357.67 |
| 15.01 | උත්සව අත්තිකාරම් | 55,000.00 |
| | | 7,000.00 |
| 17.00 | සුළු මුදල් | 10,000.00 |
| 18.00 | විවිධ ලැබීම් | 401,193.29 |
| 20.00 | මුදල් නොවූ චෙක්පත් | 2,000.00 |
| 22.00 | අවිනිශ්චිත ගිණුම් | 945,889.98 |
| 24.00 | කලින් ගෙවුම් | 1,165,162.32 |
| 30.00 | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | 757,500.00 |
| 35.01 | උපචිත වියදම් | 116,692.82 |
| 38.00 | මණ්ඩල අරමුදල | 49,462.00 |
| 43.00 | පාරිතෝෂික අරමුදල | 300,000.00 |
| 44.00 | විවිධ තැන්පතු | 515,000.00 |
| 47.00 | සිසුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 32,000.00 |
| **31.12.2012** | **පහළට ගෙන යන ශේෂය** | **174,606.04** |
| | | **21,227,495.39** |

| **පුවත්පත් කොමසාරිස්** | **ගණකාධිකාරී** | **සභාපති** |
|---|---|---|
| ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය |
| 2013 පෙබරවාරි 28 | 2013 පෙබරවාරි 28 | 2013 පෙබරවාරි 28 |

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2012.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2012 | 2011 |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ/(යෙදවූ) මුදල් ප්‍රවාහය | | රු.ශත | රු.ශත |
| බදුවලට පෙර ලාභය/අලාභය | | (79,647.99) | (877,362.64) |
| ගැලපීම්: | | | |
| ක්ෂය කිරීම | | 1,410,320.50 | 541,361.33 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | (267,170.13) | (135,851.37) |
| ස්ථාවර වත්කම් විකුණුම් | | (257,500.00) | - |
| කපා හැරීම් | | - | 200.00 |
| | | 806,002.38 | (471,652.68) |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | | 8,754.33 | 12,104.27 |
| කාරක ප්‍රාග්ධන වෙනසට පෙර ලාභය/අලාභය | | 814,756.71 | (459,548.41) |
| තොගය (පොත්) | (වර්ධනය/අඩුවීම) | 68,002.99 | (74,614.41) |
| තොගය (ලිපිද්‍රව්‍ය) | (වර්ධනය/අඩුවීම) | (66,121.84) | (11,116.74) |
| දේශීය අත්තිකාරම් | (වර්ධනය/අඩුවීම) | - | 57,000.00 |
| ලැබිය යුතු ආදායම් | (වර්ධනය/අඩුවීම) | 112,379.00 | 209,409.83 |
| උත්සව අත්තිකාරම් | (වර්ධනය/අඩුවීම) | 1,000.00 | 3,000.00 |
| ආපදා ණය | (වර්ධනය/අඩුවීම) | 186,239.00 | 193,527.75 |
| කලින් ගෙවීම් | (වර්ධනය/අඩුවීම) | (134,330.79) | (910,899.76) |
| විවිධ ණයහිමියෝ | (වර්ධනය/අඩුවීම) | - | 250.00 |
| ගෙවිය යුතු වියදම් | (වර්ධනය/අඩුවීම) | (7,340.60) | (257,162.66) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | 159,827.76 | (790,605.99) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(යෙදවූ) මුදල් ප්‍රවාහය | | | |
| ප්‍රාග්ධන අරමුදල් දායකය | | 682,000.00 | 700,000.00 |
| වාහන ඇස්තමේන්තුවෙන් ලැබීම් | | - | 9,750,000.00 |
| ස්ථාවර වත්කම් ගැනුම් | | (673,145.31) | (10,453,156.50) |
| ස්ථාවර වත්කම් විකුණුම් | | 757,500.00 | - |
| භාණ්ඩාගාරය වෙත යැවීම් | | (757,500.00) | - |
| ස්ථාවර තැන්පතු ආයෝජනය | | - | 2,094,650.20 |
| පර්යේෂණ අරමුදල් ආයෝජනය | | (417,393.11) | (61,516.94) |
| ණය ගිණුම් ආයෝජනය | | (311,905.61) | (133,316.42) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | | 309,578.58 | (905,025.37) |
| විවිධ තැන්පතු | | (448,234.32) | 278,234.32 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (859,099.77) | 1,269,869.29 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වර්ධනය/අඩුවීම | | 115,484.70 | 19,714.89 |
| **වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | 59,121.34 | 39,406.45 |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | 174,606.04 | 59,121.34 |

| **පුවත්පත් කොමසාරිස්** | **ගණකාධිකාරී** | **සභාපති** |
|---|---|---|
| ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය |
| 2013 පෙබරවාරි 28 | 2013 පෙබරවාරි 28 | 2013 පෙබරවාරි 28 |



4 - CM 017026

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | ටීඑම්/එෆ්/එස්එල්පීසී/2012 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2013 ජුනි 19 දින |

සභාපති,
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2013 අප්‍රේල් 04 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමණාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk



5 - CM 017026

අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මණ්ඩලය ආරම්භයේ සිටම රථවාහන ක්ෂය අනුපාතය සියයට 20ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 10 දක්වා අඩු කර තිබුණි. එය වෙනස් කිරීමට හේතුව හා එය වෙනස් කිරීම තුළින් මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ප්‍රතිඵලයට වූ බලපෑම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාරිතෝෂික සඳහා වූ ප්‍රතිපාදන රු. 267,170ක් වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වර්ෂයේ අලාභයට ගලපනවා වෙනුවට ආයෝජන කටයුතුවලින් වූ මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ බැහැර කරන ලද වාහනයට අදාළ ලාභය වූ රු. 257,500ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වර්ෂයේ අලාභයට ගලපා ඊට අදාළ විකුණුම් මිල වූ රු. 757,500ක් ආයෝජන කටයුතුවලින් වූ මුදල් ගලා ඒමක් ලෙස පෙන්වනවා වෙනුවට බැහැර කරන ලද මෝටර් රථයේ සම්පූර්ණ පිරිවැය වූ රු. 800,000ක මුදල් ගලා ඒමක් ලෙස පෙන්වා තිබුණි. එසේම වර්ෂය තුළ ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපාදනය වූ රු. 1,410,321ක මුදලින් බැහැර කරන ලද මෝටර් රථයේ සමුච්චිත ක්ෂය වූ රු. 300,000ක් හිලව් කර රු. 1,110,321ක් දෝෂ සහගතව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂයේ අලාභයට ගලපා තිබුණි.

#### 2.2.3 ලැබිය යුතු ගිණුම්

2009 වර්ෂයේ සිට ආයතන දෙකකින් අය විය යුතුව තිබුණු රු. 77,900ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අයකර නොතිබුණි.

2.2.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

2011 දෙසැම්බර් 29 වැනි දින සිට මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන පෞද්ගලික අංශයට අයත් ගොඩනැගිල්ල වසරකට රු. 1,920,000කට කුලියට ගැනීම සම්බන්ධයෙන් 2010 මැයි මස 14 දිනැති ජනාධිපති ලේකම් කාර්යාලයේ 1/17/1 දරන ලිපියේ 1 ඡේදය පරිදි රජයේ තක්සේරුව අනුව අවසර ලබා ගත යුතු ව තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2012 ජූලි 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී මේ පිළිබඳව සාකච්ඡා කර තිබූ අතර, හැකි ඉක්මනින් රජයේ ගොඩනැගිල්ලක් වෙත ගෙන යෑමට නියෝග ලබා දී තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 16,680,648ක ඌනතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 16,601,000ක ප්‍රදානයෙන් අනතුරුව ද එය රු. 79,648ක ඌනතාවයක් විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 14,877,363ක ඌනතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 14,000,000ක ප්‍රදානයෙන් අනතුරුව එය රු. 877,363ක ඌනතාවයක් විය. වර්ෂය තුළ වියදම් රු. 2,021,734කින් වැඩි වුවද, රජයේ ප්‍රදාන රු. 2,601,000කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 797,715ක වර්ධනය සඳහා බලපා තිබුණි.

3.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ස්ථාපිත කර ඇති මෙම මණ්ඩලය මගින් අපේක්ෂිත අරමුණු අතරින් වසර ගණනාවක සිට සිදුකරනුයේ පුවත්පත් ලියාපදිංචිය සහ පැමිණිලි විභාග කිරීම පමණි. එසේ වුවද මෙම ආයතනය පවත්වාගෙන යෑම සඳහා සේවක පඩිනඩිවලට අමතරව සමාලෝචිත වර්ෂයේදී රු. 9,933,084ක් වැය කර තිබුණි. එහෙත් පුවත්පත් ලියාපදිංචියෙන් හා ප්‍රමාද ගාස්තු අය කිරීමෙන් ලද ආදායම රු. 188,550කට සීමා වී තිබුණි. සමාලෝචිත වසර තුළ සමස්ත පුනරාවර්තන වියදම් සියයට 13කින් වැඩි වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම හා සඟරා මුද්‍රණය යන ක්‍රියාකාරකම් දෙක සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු අතර, පුවත්පත් කලාවේ දී සංගම් ලියාපදිංචි කිරීම සඳහා වූ ක්‍රියාකාරකම යටතේ සංගම් දෙකක් පමණක් ලියාපදිංචි කිරීමට සීමා වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව පැමිණිලි 42ක් ලැබී තිබූ අතර 2011 වර්ෂයේ නොවිසඳී තිබූ පැමිණිලි 10ක් සමඟ විසඳීමට තිබූ පැමිණිලි 52ක් වූ අතර ඉන් පැමිණිලි 21ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් විසඳා නොතිබුණි.

4.2 **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ අරමුණු**

මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාළ පනතේ 8(3) වගන්තිය අනුව, පුවත්පත් හා පත්‍ර කලාවේදීන් විසින් උසස් පත්‍රකලාවේ දී ආචාරධර්ම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණක් වී තිබුණි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සකසා තිබූ පුවත්පත් කලාවේදීන් විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම පද්ධතිය 1981න් පසු එනම් පසුගිය අවුරුදු 32 තුළදී වර්තමාන මුද්‍රිත මාධ්‍ය ක්ෂේත්‍රයේ සීඝ්‍ර සංවර්ධනයට සාපේක්ෂව සංශෝධනය කර නොතිබුණි. එසේම මහජනයාගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීම හා පුවත්පත් ලියාපදිංචිය හැරුණු විට මෙම ආචාර ධර්ම පද්ධතිය

පිළිබඳව අධීක්ෂණය කිරීම වෙනුවෙන් දිනපතා පළවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා වූ ක්‍රමවේදයක් මණ්ඩලය තුළ නොවී ය.

4.3 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාළ පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත්වල පළවන අසභ්‍ය, අපකීර්තිමත් හා සදාචාරාත්මක නොවන ප්‍රකාශන සම්බන්ධව සොයා බලා වරදකරුවන් අධිකරණය වෙත යොමු කිරීම සඳහා මණ්ඩලය තුළ පවත්නා යාන්ත්‍රණය ප්‍රමාණවත් වී නොතිබුණි.

(ආ) පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් පනවනු ලැබ ඇති නියෝගයන් අනුව අදාළ පුවත්පත්වල අයිතිකරුවන් විසින් ස්වකැමැත්තෙන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම මත පමණක් පුවත්පත් ලියාපදිංචි කිරීම හා ඒ මත ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සලසා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද පුවත්පත් සංඛ්‍යාව 196කට සීමා වී තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2010 වර්ෂයේ සිට ජනසංනිවේදන ඩිප්ලෝමා පාඨමාලා තුනක් හා ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වා තිබුණු අතර, ඒ ආශ්‍රිතව පහත කළමනාකරණ දුර්වලතාවයන් දක්නට ලැබුණි.

(i) 2011 වර්ෂය තුළ පවත්වන ලද ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවේ සහභාගිකයන්ගෙන් අයවිය යුතුව තිබූ සම්පූර්ණ පාඨමාලා ගාස්තුව වන රු. 525,000ක මුදලින් රු. 82,500ක් පමණක් අයවී තිබුණි. ඒ වෙනුවෙන් දරන ලද වියදම රු. 222,188ක් වී තිබුණි. සහභාගිකයින් අතුරින් සියයට 95ක්ම වෘත්තීය මාධ්‍යවේදීන් විය. මෙම මුදල් අය කර ගැනීමේ ක්‍රමවේදයක් පාඨමාලාව ආරම්භයේදී ම ඇතිකර නොතිබුණි.

(ii) 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා 2011 ජූලි මස ආරම්භ කරන ලද ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාවේ ගාස්තු ලෙස රු. 600,000ක් අයවිය යුතු වුවද, රු. 268,000ක් පමණක් අයකර ගෙන තිබුණි.

(iii) එකිනෙක පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව, සහභාගික සංඛ්‍යාව සහ අවසාන පරීක්ෂණයට පෙනී සිටි සංඛ්‍යාව පිළිබඳ විශ්ලේෂණය අනුව, පාඨමාලා සඳහා ලියාපදිංචි වන සංඛ්‍යාවෙන් සියයට 75කට ආසන්න ප්‍රමාණයක් පමණක් සහභාගී වන අතර ඉන් ද සියයට 60ක් පමණක් අවසාන පරීක්ෂණය සඳහා පෙනී සිටිති. සියයට 40ක ප්‍රතිශතයක් පාඨමාලාව හැර ගොස් තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් ඉටුකිරීමට අපේක්ෂිත පුවත්පත් කියවීම් පිළිබඳ ග්‍රාහක සමීක්ෂණයට අදාළව ලැබී තිබූ යෝජනාවලිය ඇගයීම් කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ නිර්දේශයන් නැවත ආපසු ගෙන්වා ගැනීම පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි.

එසේම මීට අදාළව 2012 ජූලි 10 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ප්‍රකාරව කටයුතු කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළු 4ක් ද, පාසැල් ජනමාධ්‍ය වැඩමුළු 3ක් ද, වෘත්තීය මාධ්‍යවේදී වැඩමුළු 1ක් ද වශයෙන් වැඩමුළු 8ක් පවත්වා තිබුණු අතර, මේ සඳහා රු. 1,686,068ක් වැය කර තිබුණි. මෙම වැඩමුළු පැවැත්වීමට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත මාධ්‍යවේදී වැඩමුළුවලින් බොහෝමයක් පෞද්ගලික අංශයට අයත් ස්ථානයන්හි පවත්වා තිබූ අතර, ඒ සඳහා සහභාගී වූ මාධ්‍යවේදීන්, කාර්ය මණ්ඩල සාමාජිකයින් හා දේශක මහතුන් වෙත නවාතැන් හා ආහාර ලබා ගැනීම වෙනුවෙන් වැඩමුළු සඳහා දැරූ මුළු වියදමෙන් සියයට 64ක් එනම් රු. 971,964ක් වැය කර තිබුණි.

(ii) තව ද, දිස්ත්‍රික් මාධ්‍යවේදී වැඩමුළු පැවැත්වීම සඳහා දිස්ත්‍රික්ක තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව හේතු පැහැදිලි කර නොතිබූ අතර, 2010 හා 2011 යන වර්ෂවල බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩමුළු දෙකක් පවත්වා තිබුණි.

2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වර්ෂ තුනක කාලයක් තුළ දිස්ත්‍රික්ක 11ක් පමණක් ආවරණය වන පරිදි වැඩමුළු පවත්වා තිබුණි.

### 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ:

(අ) සමාලෝචිත වර්ෂය තුළ රු.757,500ක වටිනාකමට බැහැර කර තිබූ මණ්ඩලයට අයත් කාර් රථයක් විකිණීමේ ක්‍රියාවලිය තුළ අනුමැතිය ලබා දීමට ප්‍රථම තක්සේරු මණ්ඩලය පත් කර තිබීම, තෝරාගත් සාර්ථක ලන්සුකරුගේ ලන්සුව පමණක් මුද්‍රා තබා තිබීම, ලන්සු විවෘත කිරීමේ දී ප්‍රසම්පාදන කමිටුවේ සියළුම සාමාජිකයින් විසින් ඒවා අත්සන් කර නොතිබීම, තෝරාගත් සාර්ථක ලන්සුකරු විසින් ලන්සු විවෘත කරන දිනයේදීම වාහනය පරීක්ෂාකර ලන්සුව ඉදිරිපත් කිරීම හා ඔහු වෙත වාහනයේ භාරකාරිත්වය එදිනම පැවරීම ආදිය මතභේදාත්මක විය;

(ආ) දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය සැකසීම සඳහා මිල ගණන් ලබා ගැනීමේ දී ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමක් සිදු කර නොතිබුනි. මිළ ගණන් කැඳවීම සඳහා තෝරාගත් ආයතනය හතරෙන් තුනක් මගින් මාරුවෙන් මාරුවට මණ්ඩලයේ අනෙකුත් කාර්යයන් කරවා ගැනීමත්, ඒ අතුරින් තෝරාගත් සැපයුම්කරු මිල ගණන් ඉදිරිපත් කළ දිනය හා අනෙකුත් ආයතන සියල්ලම මිල ගණන් ඉදිරිපත් කළ දින අතර විශේෂ කාල පමාවක් තිබීමත් හේතුවෙන් මිල ගණන් කැඳවීමේ කාර්යය විනිවිදභාවයක් සිදුකර නොතිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ:

(අ) මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාල පනතේ 22 වගන්තිය ප්‍රකාර එහි ප්‍රධාන විධායක නිලධාරියා වන පුවත්පත් කොමසාරිස් තනතුර 2010 මාර්තු 31 දින සිට වරින්වර අමාත්‍යාංශයේ නිර්දේශ මත පත්කරනු ලැබූ නිලධාරීන් විසින් වැඩබැලීමේ පදනම මත ආවරණය කර තිබුණි. එසේම 2006 සැප්තැම්බර් 02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ප්‍රකාරව මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය පිළියෙල කර අනුමත කරවාගෙන නොතිබුණ අතර, මේ හේතුවෙන් ආරම්භයේ සිටම මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ ප්‍රධාන තනතුරු 6ක් පුරප්පාඩුව පැවතුණි;

(ආ) සහකාර කොමසාරිස් (විමර්ශන) තනතුර සඳහා 2009 සැප්තැම්බර් 01 දින සිට 2012 අගෝස්තු 31 දක්වා වූ අවුරුදු තුනක කාලයකට ද්විතියික පදනම මත නිලධාරියකු බඳවාගෙන තිබුණ ද ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති සටහන්වල මණ්ඩලය සංස්ථාපනය කළ අණපනත් හා ප්‍රධාන කාර්යභාරය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂය වෙනුවෙන් මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, එය 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5වන පරිච්ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කර නොතිබුණි. ඒ හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම, මණ්ඩලයේ කාර්ය සාධනය සැලසුම් කිරීම සඳහා වූ ඵලදායී යාන්ත්‍රණයක් ලෙස යොදාගත නොහැකිව තිබුණි. තව ද, එම චක්‍රලේඛයෙහි 4.2.2 ඡේදය ප්‍රකාර ආයතනයේ තථ්‍ය කාර්යසාධනය සැලසුම් කළ පරිදි ඉටුවන බව හා අවශ්‍ය ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගනු ලබන බව තහවුරු කර ගැනීම පිණිස මණ්ඩලය මගින් සංයුක්ත සැලැස්ම, අයවැය හා කාර්යසාධනය කාලීනව විමර්ශනයට ලක්කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය තුළ ද මණ්ඩලයේ කටයුතු හා ගනුදෙනු අභ්‍යන්තර විගණනයට ලක්කර වාර්තා කිරීමේ අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

5.4 **ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජා.ප්‍ර.නි. චක්‍රලේඛයේ 4.2.1 ඡේදය ප්‍රකාර, මණ්ඩලයේ ප්‍රසම්පාදන කටයුතුවල දී ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය තහවුරු කර ගැනීමේ පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවක් ලෙස ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර, එදිනෙදා අවශ්‍ය වනු ලබන සැපයුම් හා සේවාවන් පූර්ව සැලසුම් කිරීමකින් තොරව සපයා ගන්නා බව නිරීක්ෂණය විය.

5.5 **අයවැය ලේඛන පාලනය**

අයැවයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 11 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

5.3 **පද්ධති හා පාලනය**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ලිපිද්‍රව්‍ය තොග පාලනය,
(ආ) පාඨමාලා වැඩමුළු පැවැත්වීම,
(ඇ) ගිණුම්කරණය,
(ඉ) සේවක මණ්ඩල කටයුතු.

**එච්. ඒ. එස්. සමරවීර,**
විගණකාධිපති.